ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No
ඔබේ අංකය / உமது இல. / Your No
දිනය / திகதி / Date: 2023.11.01

| | | | |
|---|---|---|---|
| පැමිණිලිකාරිය | :- | ඒ.සීලවති මිය,<br>අවසාන නිවස, පල්ලිය පාර,<br>අශ්වයා බැඳිවැව, ගලෙන්බිඳුනුවැව. | |
| අතුරුදහන් වූ අය | :- | ආර්.එම්.සුගත් බණ්ඩාර තෙන්නකෝන් | |
| වගඋත්තරකරුවන් | :- | 01. | පොලිස් පරීක්ෂක - කේ.එම් සිරිමෙවන් කරුණාතිස්ස මයා,<br>ස්ථානාධිපති,<br>පොලිස් ස්ථානය<br>ගලෙන්බිඳුනුවැව. |
| | | 02. | පොලිස් පරීක්ෂක - ඩබ්ලිව්.ඩී.බී.ෆොන්සේකා මයා,<br>පොලිස් ස්ථානය<br>ගලෙන්බිඳුනුවැව. |
| | | 03. | පොලිස් කොස්තාපල් 38646 - එම්.ජී.එස්.ප්‍රියදර්ශන මයා,<br>පොලිස් ස්ථානය<br>ගලෙන්බිඳුනුවැව. |

<u>පැමිණිලි අංකය :- **HRC/AP/237/2016(S)**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාර ඒ.සීලවතී යන අය කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2016.04.26 වන දින තම පුතා වන ආර්.එම්.සුගත් බණ්ඩාර තෙන්නකෝන් යන අය මාළු වෙළදාම කිරීම සඳහා උදේ 7.30-8.00 පමණ කාලයේදී ගලෙන්බිඳුනුවැව නගරයට යතුරුපැදියෙන් ගිය බවත්, අනතුරුව ගලෙන්බිඳුනුවැව නගරය මැද දී ගලෙන්බිඳුනුවැව පොලිසියේ නිලධාරීන් පැමිණ තම පුතා වන සුගත් බණ්ඩාර යන අයව කටඋත්තරයක් ලබා ගැනීමට යැයි පවසා පොලිසියට රැගෙන ගොස් ඇති බවත් එම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අවස්ථාවේ එහි අන්නාසි විකුණමින් සිටි නජීම් යන අයට යතුරු පැදිය හා මාළු පෙට්ටිය බාර දෙන ලද බවත් දක්වා ඇත. ඉන් පසු තම ඥාති සහෝදරයෙකු පොලිස් ස්ථානයේ තම දරුවා සිටිනු දැක ඒ සම්බන්ධයෙන් තමාට දැනුවත් කළ වහාම තමා පොලිස් ස්ථානය වෙත ගොස් විමසා බලන ලද බවත්, එහිදී ගලෙන්බිඳුනුවැව නගරයේ කඩයක් කඩා දුම්වැටි සොරාගෙන ඇති බවට CCTV දර්ශන වල පවතින බැවින් අත්අඩංගුවට ගත් බවට පවසන ලද බවත් සඳහන් කර ඇත. ඉන් අනතුරුව 2016.04.26 වන දින රාත්‍රී 10.00 ත් 11.00 අතර කාලයේදී පොලිස් නිලධාරීන් විසින් තම පුතාගේ ඇඳුම් ඉවත් කර උදලු මිටකින් හා අත් පා වලින් පහරදී ඇති බවත්, එහිදී තම පුතා සිහිසුන් වී ඇති අතර, ඉන් පසුව නිලධාරීන් 06 දෙනකු පමණ තම පුතාව ජීප් රථයට දමාගෙන ගලෙන්බිඳුනුවැව රෝහලට ගෙන ගොස් ඇති බවත්, ඉන්පසුව නැවත පොලිස් ස්ථානයට ගෙන ඒමෙන් පසුවද මිලේච්ඡ අයුරින් පහරදී ඇති බවත් දක්වා ඇත.

පැමිණිලිකාරිය තම පැමිණිල්ලෙන් ඉල්ලා සිට ඇත්තේ, තම පුතා වන සුගත් බණ්ඩාර යන අයට පොලිස් නිලධාරීන් විසින් සිදු කළ පහරදීම හා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර සාධාරණය ඉටුකර දෙන ලෙසයි.

**අගතියට පත් සුගත් බණ්ඩාර තෙන්නකෝන් යන අයගේ ප්‍රකාශය :-**

අගතියට පත් සුගත් බණ්ඩාර තෙන්නකෝන් යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2016.04.26 වන දින උදේ 7.30-8.00 අතර ගලෙන්බිඳුනුවැව ටවුමේ මහජන කඩය ඉදිරිපිට මාළු විකුණමින් සිටියදී පොලිස් පරීක්ෂක ෆොන්සේකා මහතා හා තවත් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ත්‍රිරෝද රථයකින් පැමිණ තමන්ව අත්අඩංගුවට ගත් බවත්, එම අවස්ථාවේදී තමාගේ යතුරු පැදිය හා වෙළදාම් කරමින් සිටි මාළු එම ස්ථානයේ අන්නාසි වෙළදාම් කරමින් සිටි නජීම් නැමැති අයට භාර දුන් බවත්, තමන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී එහි පිරිසක් සිටි බවත් දක්වා ඇත.

ඉන් පසු තමාව පොලිසිය වෙත රැගෙන ගොස් උදේ 8.20ට පමණ සිර මැදිරියට දැමූ බවත්, පසුව එදින රාත්‍රී සිර මැදිරියෙන් එළියට ගෙන උඩු මහලට රැගෙන ගොස් පොලිස් පරීක්ෂක ෆොන්සේකා හා පොලිස් කොස්තාපල් ප්‍රියදර්ශන යන නිලධාරීන් තම සරම ගලවා අත්දෙක බැඳ අනතුරුව ප්‍රියදර්ශන නිලධාරියා තමාගේ යටිපතුල්වලට පොල්ලකින් පහරදුන් බවත්, ෆොන්සේකා නිලධාරියා විසින් අතින් පයින් තම මුහුණට හා බඩට පහරදුන් බවත් දක්වා ඇත. තමන්ට පහරදෙන විට සිහිසුන් වූ බවත්, නැවත සිහිය ලැබෙන විට සිර මැදිරියේ සිටි බවත්, පසුව තමන්ව අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා අනුරාධපුරට රැගෙන ආ බවත්, මහේස්ත්‍රාත්වරයාගේ නිල කාමරය වෙත තමන් ඉදිරිපත් කළ අතර එහිදී තමන්ට සිදුකළ පහරදීමෙන් සිදුව ඇති තුවාල පිළිබඳව තම නීතිඥයා මහේස්ත්‍රාත්තුමා වෙත දැන්වූ බවත්, අනතුරුව අධිකරණ නියෝග මත ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත බන්ධනාගාර නිලධාරීන් විසින් යොමු කළ බවත් දක්වා ඇත.

අගතියට පත් සුගත් බණ්ඩාර යන අයද කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත්තේ, තමන් කිසිදු වරදක් කර නොතිබියදී සැකයක් මත තමන්ව අත්අඩංගුවට ගෙන පහරදී සිදුකළ අසාධාරණය සම්බන්ධයෙන් සාධාරණය ඉටු කර දෙන ලෙසය.

**වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ-ස්ථානාධිපතිගේ ප්‍රකාශය :-**

ගලෙන්බිඳුනුවැව පොලිසියේ ස්ථානාධිපති විසින් ඉදිරිපත් කර ඇති 2016.05.16 දිනැති වාර්තාව මඟින් දන්වා ඇත්තේ, ගලෙන්බිඳුනුවැව නගරයේ වෙළඳ සැලක් බිඳ දේපල සොරකම් කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් පොලිසිය වෙත ලැබී ඇති බවත්, (ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොත - පිටුව 238 ඡේද 14) එම පැමිණිල්ලට අනුව විමර්ශනය කර ඇති බවත්, විමර්ශනයේදී වෙළඳ සැලේ සවිකර තිබූ C.C.T.V. කැමරාවේ වෙළඳ සැලට ඇතුල් වූ අයගේ ඡායාරූප ඇති බවත්, C.C.T.V දශන් උපයෝගී කර ගනිමින් අනාවරණය වූ සාක්ෂි මත සුගත් බණ්ඩාර යන අයව 2016.04.26 දින පැය 21.45ට අත්අඩංගුවට ගෙන ඇති බවත්ය.

**2 හා 3 වන වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ :-**

2016.04.26 වන දින රාත්‍රී කාලයේ වෙළඳ සැලක් බිඳ දේපල සොරකම් කිරීමක් සම්බන්ධයෙන් ලද පැමිණිල්ලක් අනුව අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා ලෙස ස්ථානාධිපතිගේ උපදෙස් මත විමර්ශනයක් ආරම්භ කළ බවත්, මෙම විමර්ශනය සඳහා අදාළ වෙළඳ සැලේ සවිකර තිබූ C.C.T.V. කැමරා පද්ධතියද උපයෝගී කර ගනු ලැබූ බවත්ය.

පොලිසිය වෙත ලද පැමිණිල්ලේ සොරකම සිදුකළ අයෙකු පිළිබඳව ඍජු පැමිණිල්ලක් නොතිබූ බැවින් C.C.T.V. කැමරා පද්ධතියේ අඩංගුව තිබූ ඡායාරූප පිළිබඳව විශේෂ සැලකිල්ල යොදවා අදාළ සොරකම සිදුකළ පුද්ගලයා සෙවීමට කටයුතු කළ බවද දක්වා ඇත.

සොරකම සම්බන්ධයෙන් පුද්ගලයන් බොහෝ දෙනෙකුගෙන් තොරතුරු ලබා ගත් බවත්, එහිදී වැලිජීය ගමගේ රංජිත් ගමගේ යන අයගෙන් ලබාගෙන ඇති ප්‍රකාශයට අනුවද මෙම සුගත් බණ්ඩාර යන අය සොරකමට සම්බන්ධ බවට සාක්ෂි ලද බවත්, ඒ අනුව සුගත් බණ්ඩාර යන අයගේ සජීව රූපය සමඟින් ඡායා රූපයද සන්සන්ධනය කර අදාළ සොරකමට සුගත් බ්ණ්ඩාර සම්බන්ධ බවට කරුණු පැහැදිලි වන හෙයින් පැමිණිලිකාර සුගත් බණ්ඩාර යන අයව 2016.04.26 වන දින වරද කියා දී ඇල්ලවල ඇනිකට් එක අසලදී පැය 21.45ට අත්අඩංගුවට ගනු ලැබූ බවද දක්වා ඇත.

එමෙන්ම මෙම අගතියට පත් අයව අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුට කිසිඳු පහරදීමක් කර නොමැති බවත්, අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට පෙර ඔහු වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කළ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය :-**

රාත්‍රී කාලයේ වෙළඳ සැලක් බිඳ රුපියල් 3,40000.00 වටිනා දේපළ සොරකම් කිරීමක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් 2016.04.12 වන දින ගලෙන්බිඳුනුවැව පොලිසිය වෙත ලැබී ඇති අතර, 2016.04.26 වන දින තොරතුරට අදාළ ඡායාරූපයේ සිටින පුද්ගලයා වන මාළු චන්ඩි නමින් හඳුන්වන මෙම සුගත් බණ්ඩාර යන අය අල්ලා ගැනීමට සැරසෙද්දී දුවන්නට වූ බවත්, ඇනිකට් එකේ කැළය දෙසට දිවගිය අයකු කැ ගසනු ඇසී පරීක්ෂා කිරීමේදී මෙම පුද්ගලයා ඇලපතුලට රෝල් වී ගොස් ඇති බවත්, ඔහුගේ ශරීරයේ ලේ තැවරී තිබූ අතර, ඔහු මාළු චන්ඩි නැමැති අය බවට ප්‍රකාශ කළ බවත්, ඔහුගේ මුහුණ තඩිස්සි වී තොල පැලී තිබූ බවත් වගඋත්තර පාර්ශවයේ උධෘත අනුව දක්වා ඇත. ඒ අනුව 2016.04.26 වන දින පැය 21.45ට සුගත් බණ්ඩාර යන අයව 'ඇල්ලවල ඇනිකට්' එක අසලදී අත්අඩංගුවට ගත් බවද දක්වා ඇත.

අනතුරුව රාත්‍රී කාලයේ වෙළඳ සැලක් බිඳ රුපියල් 3,40000.00 වටිනා සිගරට් පෙට්ටියක් සොරකම් කිරීම පිළිබඳව සුගත් බණ්ඩාර යන අයට එරෙහිව අංක B 1226/2016 යටතේ ගරු අධිකරණය වෙත 2016.04.27 දින කරුණු වාර්තා කර ඇති අතරම අංක 147/16 යටතේ නඩු බඩු ලේඛනගත කර ඇත. එසේම අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම අංක 161/16 යටතේ 2016.04.26 දින සුගත් බණ්ඩාර යන අයව ගලෙන්බිඳුනුවැව රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත.

**අධිකරණ වෛද්‍ය වාර්තාව :-**

වගඋත්තරකාර පාර්ශවය විසින් උධෘත සමඟ ඉදිරිපත් කර ඇති ගලෙන්බිඳුනුවැව රජයේ ස්ථාන භාර වෛද්‍ය නිලධාරී, වෛද්‍ය සී.එන්.ජේ ධම්මිආරච්චි මහතා විසින් නිකුත් කර ඇති 2016.04.26 දිනැති අංක 161/6 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ 'කටින් මත්පැන් වහනය වේ'. 'මත්පැන් බී වෙරි වී හා පාවිච්චි කරන ලදී' යන්නෙන් වෛද්‍ය මතය ඉදිරිපත් වී ඇත. එමෙන්ම තුවාල නොමැති බවට වෛද්‍ය මතය ඉදිරිපත් කර ඇත.

නමුත් වගඋත්තර පාර්ශවීය පො.ප ෆොන්සේකා මහතාගේ විභාග සටහන් අනුව (378/94) 'මෙම පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට යාමේදී, ඇඳ වැටී ඇති බවත්, ඒ හේතුවෙන් ඔහුගේ තොල පැලී, මුහුණ තඩිස්සි වී තිබූ බවත්' සටහන් කර තිබියදී වෛද්‍යවරයා එය නොදැකීම ප්‍රශ්නසහගත වේ.

2016.04.27 දින මෙම අයව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව අධිකරණ නියෝග මත 2016.04.28 වන දින අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කර ඇති අතර, එහිදී පරීක්ෂා කරන ලද වෛද්‍යවරයා විසින් 'මුහුණේ මෘදු වීමක්, සීරීමක්' පවතින බවට 16-45784 දරණ රෝග විනිශ්වය තුන්ඩුවේ සටහන් කොට ඇත. එසේම මෙම සුගත් බණ්ඩාර යන අය අනුරාධපුර ශික්ෂණ රෝහලෙන් නිදහස් කරන ලද 2016.05.06 වන දින රෝගියා පරීක්ෂා කරන ලද අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් දකුණු හා වම් කණේ කම්පන සහගත සිදුරු ඇති

බවට සටහන් කොට ඇති බව අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති අංක 240/16 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවෙන් පැහැදිලි වේ.

එකී තුවාල යටතේ අගතියට පත් අයගේ දකුණු කණෙහි ශ්‍රවණ පටලය 20% සිදුරු වී ඇති බවටත්, වම් කණෙහි ශ්‍රවන පටලය 15%ක් සිදුරු වී ඇති බවටත්, එය මොට ආයුධයකින් සිදු වී ඇති බවටත් දන්වා ඇත.

(1).Right ear 20% traumatic perforation present.

(2).left ear 15% traumatic perforation present.

වෛද්‍යවරාගේ මතය යටතේ (1) -(2) තුවාල බරපතල නොවන තුවාල ලෙස සඳහන් කර ඇත.

තවද රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබා දී ඇති කෙටි රෝග ඉතිහාසය අනුව "2016.04.26 වන දින රෑ ගලෙන්බිඳුනුවැව පොලිසියේ ෆොන්සේකා මහත්තයයි, කපිල සුදර්ශන මහත්තයයි අතිනුයි බැටන් පොලූ වලිනුයි මට ගැහුවා" යනුවෙන් සටහන් යොදා ඇත.

මේ අනුව, සමස්ත තුවාල සටහන් වින්දිත දක්වන පහරදීම් ආකාරය හා සැසඳෙන බවද නිරික්ෂණය වේ.

**නිරික්ෂණය :-**

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මඟින් ප්‍රධාන කොටම ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකරුවන් විසින් තම දරුවා වන සුගත් බණ්ඩාර යන අය කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන පහරදී වධහිංසා කිරීමෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බවය.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, වෙළඳ සැළක් බිඳ මුදල් හා භාණ්ඩ සොරකම් කිරීමක් සම්බන්ධයෙන් 2016.04.12 වන දින පැය 8.30ට (238/14) ගලෙන්බිඳුනුවැව පොලිසිය වෙත ලද පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විසින් විමර්ශනයක් ආරම්භ කර ඇති බවයි.

වගඋත්තරකරුවන්ගේ විමර්ශනය සඳහා අදාළ වෙළඳ සැළේ සවිකර තිබූ C.C.T.V.කැමරාවේ සටහන්ව තිබූ දිනයට අදාළ ඡායාරූප පිළිබඳව වගඋත්තරකරුවන් විශේෂ අවධානයක් යොමු කරමින් එම ඡායාරූපයේ සඳහන් පුද්ගලයා පිළිබඳව ද විශේෂ විමර්ශනයක් සිදුකර ඇති බව නිරික්ෂණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ විමර්ශනය පදනම් කර ගනිමින් C.C.T.V කැමරා පද්ධතියේ සටහන්ව තිබූ ඡායාරූප සුගත් බණ්ඩාර යන අයගේ රූපයට සමාන වන බවට වගඋත්තරකරුවන් නිගමනය කිරීමෙන් පසු සුගත් බණ්ඩාර යන අයව 2016.04.26 වන දින අත්අඩංගුවට ගත් බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත. වගඋත්තරකරුවන්ගේ උධෘත අනුව මෙම අය අත්අඩංගුවට ගෙන ඇත්තේ, 2016.04.26 දින පැය 21.45ට

'ඇල්ලවල ඇනිකට්' එක අසලදී තවත් පුද්ගලයන් දෙදෙනෙකු සමඟ මත්පැන් පානය කරමින් සිටියදී බවට දැක්වේ.

පැමිණිලිකාරියගේ පැමිණිල්ල අනුව සුගත් බණ්ඩාර යන අයව අත්අඩංගුවට ගෙන ඇත්තේ, 2016.04.26 දින උදේ 7.30ත් 8.00ත් අතර කාලයේදී ගලෙන්බිදුනුවැව නගරයේ මහජන වෙළඳ සැළ ඉදිරිපිට මාළු විකුණමින් සිටියදී වේ.

එමෙන්ම මෙම සුගත් බණ්ඩාර යන අය උදෑසන මාළු විකුණමින් සිටියදී පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන පොලිසිය වෙත රැගෙන ගිය බවට සාක්ෂි වශයෙන් දිවුරුම් ප්‍රකාශ දෙකක් ඉදිරිපත් කර ඇති අතර, ඉන් ජිනදාසගේ දම්මික අලුත්ගම යන අය විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මඟින් සඳහන් කර ඇත්තේ, "තමා 2016.04.26 වන දින උදෑසන ගලෙන්බිදුනුවැව නගරයට පැමිණි අවස්ථාවේදී තම හිතවතෙකු වන සුගත් බණ්ඩාර යන අය පෙ.ව 8.30 ට පමණ ගලෙන්බිදුනුවැව පොලිසියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති බවට දැනගැනීමට ලැබුනු බවයි. ඒ අනුව තමා පෙ.ව 9.40 ට පමණ ගලෙන්බිදුනුවැව පොලිස් ස්ථානයට ගිය බවත්, එහි දෙවන සිරමැදිරියේ සුගත් බණ්ඩාර යන අය රඳවා සිටිනු දුටු අතර, ඒ අවස්ථාවේ ඔහුගේ කිසිදු තුවාලයක් නොතිබූ බවත්" සඳහන් කර ඇත.

තවද, වන්නිහාමිගේ සෙනවිරත්න යන අය විසින් පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ, තමා 2016.04.26 වන දින උදෑසන ගලෙන්බිදුනුවැව නගරයට ගිය අවස්ථාවේදී එහි සිටි වෙළෙන්දෙකු වන නජීම් යන අයගෙන් 'මාළුකාරයා කෝ' යනුවෙන් විමසූ විට, මාළු විකුණන තැනැත්තා උදෑසන පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් බවට නජීම් යන අය විසින් දන්වන ලද බවත් සඳහන් කර ඇත. මේ අනුව සුගත් බණ්ඩාර යන අය 2016.04.26 වන දින උදෑසන 9.40 ට පෙර මාළු විකුණමින් සිටියදී අත්අඩංගුවට පත්ව ඇති බව නිරීක්ෂණය කළ හැකිය.

වගඋත්තරකරුවන්ගේ විමර්ශනයේදී C.C.T.V කැමරා පද්ධතියේ සටහන්ව තිබූ ඡායාරූප මෙම සුගත් බණ්ඩාර යන අයගේ රූපයට සමාන වන බවට වගඋත්තරකරුවන් සඳහන් කර ඇතත්, ඒ සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් කර ඇති බවට පැහැදිලි කරුණු ඉදිරිපත් වීමක් සිදුව නොමැති බවත්, C.C.T.V කැමරා දර්ශන මතම පදනම්ව අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවත් නිරීක්ෂණය වේ. සුගත් බණ්ඩාර යන අයට එරෙහිව ඉදිරිපත් වී ඇති පැමිණිල්ල 2016.04.12 වන දින පොලිස් ස්ථානයට ඉදිරිපත් වී ඇති නමුත් ඒ සම්බන්ධයෙන විමර්ශනයක් කර සාක්ෂි සටහන් කිරීමක් හෝ C.C.T.V දර්ශන හැරුනුකොට වෙනත් තොරතුරු සොයා බැලීමක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් වී නොමැති අතර, වගඋත්තර පාර්ශවය විසින් සිය කරුණු දැක්වීමේදී, සාක්ෂි ලෙස ලබා දී ඇති රංජිත් ගමගේ යන අයගේ සාක්ෂියද ලබාගෙන ඇත්තේ, 2016.05.12 වන දින එනම්, වින්දිතයා අත්අඩංගුවට ගැනීමෙන් දින 15ට පසුව බව අදාළ සටහන් මඟින් නිරීක්ෂණය වේ. **මේ අනුව පොලිස් නිලධාරීන් විසින් විධිමත් හා නිසි විමර්ශනයකින් තොරව මෙම සුගත්**

බණ්ඩාර යන අයව අත්අඩංගුවට ගෙන ඇති බවට නිරීක්ෂණය වන බැවින් එමගින් වින්දිත වන සුගත් බණ්ඩාර තෙන්නකෝන් යන අයගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 37 වන වගන්තිය ප්‍රකාරව "වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබූ තැනැත්තෙකු අවස්ථාගත සියළු කරුණු අනුව යුක්ති සහගත වන කාලයකට වඩා දීර්ඝ කාලයක් අත්අඩංගුවේ රඳවා තබා ගැනීම හෝ අන් ලෙසකින් රැඳවීම කිසිම සාම නිලධරයෙකු විසින් නොකළ යුතු අතර, ඒ කාලය සිරභාරයට ගැනීම සිදුකළ ස්ථානයේ සිට මහේස්ත්‍රාත්වරයා වෙත යාමට අවශ්‍ය කාලය අතහැර ගණන් බැලිය යුතු පැය විසිහතරක කාලය නොඉක්මවිය යුතුය" වශයෙන් දක්වා ඇත.

ඒ අනුව, අගතියට පත් සුගත් බණ්ඩාර 2016.04.26 වන දින පෙ.ව.7.00-8.00ත් අතර කාලයේදී අත්අඩංගුවට ගෙන ඇති බවට ඉදිරිපත්ව ඇති තොරතුරු අනුව සෑහීමකට පත්විය හැකි වුවද, ඔහුව ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ, 2016.04.27 දින තෙක් එනම්, පැය 26.20 ක කාලයකින් පසුවය. එයද කොමිෂන් සභාවේ අවධානයට යොමු වී ඇත. එසේම වින්දිත සුගත් බණ්ඩාර තෙන්නකෝන් යන අය අත්අඩංගුවට ගැනීමෙන් පසුව ගලෙන්බිදුනුවැව පොලිස් ස්ථානයට භාර දෙන අවස්ථාවේ, එනම් 2056.04.26 දින වින්දිත සුගත් බණ්ඩාර තෙන්නකෝන් භාරගත් ගලෙන්බිදුනුවැව පොලිස් ස්ථානයේ උපසේවක විසින් යොදා ඇති සටහන් වල වින්දිත වන සුගත් බණ්ඩාර තෙන්නකෝන් යන අයගේ 'මුහුණෙහි දකුණුපස තඩිස්සි වී ඇති අතර, තොල්පටිවලින් ලේ වහනය වී ඇති අතර, ඇවිදීමට අපහසු බව කියා සිටියි' යනුවෙන් සටහන් කර තිබීමද වැඩිදුරටත් කොමිෂන් සභාවේ අවධානය යොමු විය.

අගතියට පත් පුද්ගලයා සඳහන් කර ඇත්තේ, ඔහුට පොලිස් පරීක්ෂක ෆොන්සේකා මහතා හා පොලිස් කොස්තාපල් 38646 ප්‍රියදර්ශන යන පොලිස් නිලධාරීන් විසින් පහරදීම කළ බවය.

අගතියට පත් පුද්ගලයා වන සුගත් බණ්ඩාර යන අය 2016.04.26 දින අත්අඩංගුවට ගෙන 2016.04.27 දින පෙ.ව 10.20ට ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු බන්ධනාගාර ගත කර ඇත.

අධිකරණ නියෝග මත අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු 2016.05.06 වන දින අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් මෙම අයව පරීක්ෂා කර ඇති අතර, සුගත් බණ්ඩාර යන අයට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව එම අයගේ දකුණු කණෙහි ශ්‍රවණ පටලය කම්පන සිදුරුවීම 20% ලෙසද වම් කණෙහි ශ්‍රවණ පටලය කම්පන සිදුරුවීම 50% වන බවත්, සිදුරුවීම මොට ආයුධයක් මගින් සිදුව ඇති බවත් දන්වා ඇත.

(1).Right ear 20% traumatic perforation present.

(2).left ear 15% traumatic perforation present.

පැමිණිලිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව හා ඉදිරිපත්ව ඇති සියලූ ලේඛන කෙරෙහි අවධානය යොමු කිරීමේදී පොලිස් දෙපාර්තමේන්තුව භාරයේ සිටියදී (2)-(3) වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ 1978 **ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවටද මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.**

පැමිණිලිකරුව පොලිස් ස්ථානය තුළදී වධහිංසාවට ලක්ව තිබීමෙන් පෙනී යන්නේ, 2016.04.26-27 දිනයන්හි දී ගලෙන්බිඳුනුවැව පොලිසියේ ස්ථානාධිපති ලෙස කටයුතු කර ඇති (1) වගඋත්තරකරුගේ ප්‍රමාණවත් අධීක්ෂණයක් අත්අඩංගුවට පත් තැනැත්තා කෙරෙහි යොමුවී නොමැති බවය. ඒ අනුව (1) වන වගඋත්තරකරු තම අධීක්ෂණ වගකීම ඉටුකර නොමැති බවටද මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. ඒ අනුව, වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලි පාර්ශවයේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ සහ 13(1) වන ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, **වගඋත්තරකාර පො.ප - ඩබ්.ඩී.බී ෆොන්සේක නිලධාරී සහ පො.කො 38646 එම්.ඒ.එස් ප්‍රියදර්ශන** යන නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතුය.

02. තවද, 2 වන වගඋත්තරකාර පො.ප ඩබ්.ඩී.බී ෆොන්සේකා සහ 3 වන වගඋත්තරකාර පො.කො 38646 එම්.ඒ.එස් ප්‍රියදර්ශන යන අය විසින්, වින්දිත ආර්.එම් සුගත් බණ්ඩාර තෙන්නකෝන් යන අය වෙත තම පුද්ගලික මුදලින් රු. 30,000/-ක (රුපියල් තිස්දහසක) මුදලක් ගෙවිය යුතුය.

03. එසේම, මෙම අත්අඩංගුවට ගැනීම, පහරදීම සහ ඊට අදාළ සියළු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකරුගේ ප්‍රමාණවත් අධීක්ෂණයක් යොමු වී නොමැති බැවින් 1 වන වගඋත්තරකරු තම අධීක්ෂණ වගකීම ඉටු නොකිරීම මත පළවන වගඋත්තරකාර පො.ප - කේ.එම්. සිරිමෙවන් කරුණාතිස්ස යන අය සම්බන්ධයෙන්ද සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු වේ.

2023.11.30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

පොලිස්පතිවරයා විසින්ද මේ සම්බන්ධව සුදුසු විනය ක්‍රියාමාර්ග ගෙන ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. අධ්‍යක්ෂ, - අදාළ නිලධාරී වෙත නිර්දේශය යොමු කිරීමට
පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
මානව හිමිකම් කොට්ඨාශය,
අංක : 07, 7 වන මහල, කොටා ටෙරස්
එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.

B/